# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2034/13 – 2017 අගෝස්තු 29 වැනි අඟහරුවාදා – 2017.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/COM/02/P/2015/167.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එම්. පී. එස්. ජයසේකර මයා, නාලනී රත්නායක මිය බාරේ, අංක 256, වැලියාය, මොණරාගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, පුද්ගලික තැපැල් මල්ල, පැල්වත්ත, බුත්තල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිලියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89 එෆ්, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,  
කම්කරු, වෘත්තීය සමිති සබඳතා  
හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 අගෝස්තු මස 22 වැනි දින,  
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/P/2015/167.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එම්. පී. එස්. ජයසේකර මයා, නාලනී රත්නායක මිය බාරේ, අංක 256, වැලියාය, මොණරාගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, පුද්ගලික තැපැල් මල්ල, පැල්වත්ත, බුත්තල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ** –

''සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කරන ඩී. එම්. පී. එස්. ජයසේකර මහතා විසින් 2011.06.08 දින සිට 2014.11.30 දින දක්වා වූ කාලය තුළ සේවා මුර ප්‍රධාන තනතුරේ රාජකාරී ආවරණය කිරීම වෙනුවෙන් ආවරණ දීමනාවක් නොගෙවීම මඟින් තමාට අසාධාරණයක් සිදුව ඇති බවට කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද යන්න සහ එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන).

2017 ජූලි මස 22 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 285

---

මගේ අංකය: IR/COM/01/2017/51.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අනිල් කොස්වත්ත මයා, අංක 275/4, ප්‍රධාන පාර, අත්තිඩිය, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

නෙස්ලේ ලංකා පීඑල්සී. අංක 440, ටී. බී. ජයා මාවත. කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128. එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා
හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2017/51.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අනිල් කොස්වත්ත මයා, අංක 275/4, ප්‍රධාන පාර, අත්තිඩිය, දෙහිවල.
සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

නෙස්ලේ ලංකා පීඑල්සී. අංක 440, ටී. බී. ජයා මාවත. කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ –

''නෙස්ලේ ලංකා පීඑල්සී සමාගමේ සේවය කළ අනිල් කොස්වත්ත මහතා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ දී ඔහුගේ මුල් පත්වීම් ලිපියේ සඳහන් විශ්‍රාම වැටුප් ක්‍රමවේදයට බැහැරව ඔහු එකඟ නොවූ වෙනත් ක්‍රමවේදයකට අනුව විශ්‍රාම වැටුප ගණනය කිරීම නිසා ඔහුට අසාධාරණයක් සිදුව තිබේද? එසේ සිදුව තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන).

2017 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 286

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.